# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2026.09.18 පැය 1615 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/1531/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**ශ්‍රී දේවගිරි රජමහා විහාරස්ථානයේ බිනර මහා පෙරහර හේතුවෙන් රථවාහන ගමනාගමනය සීමා කිරීම.**

බිංගිරිය පොලිස් වසමේ ශ්‍රී දේවගිරි රජමහා විහාරස්ථානයේ බිනර මහා පෙරහර 2026.09.19 දින රාත්‍රී 07.00 සිට රාත්‍රී 09.00 දක්වා පැවැත්වෙන අතර පෙරහර බිංගිරිය ශ්‍රී සරණංකර ජාතික පාසල අසලින් ආරම්භ වී හලාවත කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ වීථි සංචාරය කිරීමට නියමිතව ඇත.

ඒ අනුව පෙරහර හලාවත කුරුණෑගල මාර්ගයේ වීථි සංචාරය කරන කාලසීමාව තුල ඇතිවන රථවාහන තදබදය අවම කරගැනීම සඳහා පහත විකල්ප භාවිතා කරන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

**විකල්ප මාර්ග -**

- කුරුණෑගල දෙස සිට හලාවත දෙසට ගමන් කරන සියළුම රථවාහන බිංගිරිය පොලිස් ස්ථානය අසලින් වමට හැරී විහාර මාවතේ ගමන් කර කරව්වැව අසලින් දකුණට හැරී කහවලවත්ත පුස්තකාලය අසලින් වමට හැරී තල්ගහමුල හන්දියෙන් දකුණට හැරී තල්ගහපිටිය දක්වා ගමන් කර වමට හැරී හලාවත දෙසට ගමන් කල හැක.
- හලාවත දෙස සිට කුරුණෑගල දෙසට ගමන් කරන රථවාහන ඉහත මාර්ගයේම ගමන් කර බිංගිරිය පොලිස් ස්ථානය අසලින් ප්‍රධාන මාර්ගයට පිවිස දකුණට හැරී කුරුණෑගල දෙසට ගමන් කල හැක.

ඉහත නිවේදනය සම්බන්ධයෙන් ඔබ මාධ්‍ය මගින් ප්‍රචාරයක් ලබා දෙන මෙන් ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**